**තර්ක ශාස්ත්‍රය හා විද්‍යාත්මක ක්‍රමය - 13 ශ්‍රේණිය**

01) පහත දැක්වෙන මාතෘකා සඳහා කෙටි සටහන් ලියන්න.

a) ශුද්ධ විද්‍යාව ව්‍යවහාර විද්‍යාව සනාථ කරන පරීක්ෂණයකි.
b) ස්වභාවික හා සමාජ විද්‍යාවන්හි ප්‍රභේදයට මුල් වූ පදනම
c) ප්‍රොපෙරියානු මිනුම

02)

I. විද්‍යාත්මක වාද හා නියම අතර වෙනස්කම් මොනවාද?
II. අද සමාජ විද්‍යාවන් ශීඝ්‍රයෙන් තාක්ෂණ බවට පත්වනු මිස ශුද්ධ විද්‍යාවක් ලෙස වර්ධනය වනු නොපෙනේ. මෙම ප්‍රකාශය සාකච්ඡා කරන්න.

03)

I. දාදු කැටයකට මෙන්ම ගිනි පෙට්ටියකට ද ඇත්තේ පැති හයකි. සාම්ප්‍රදායික අර්ථකරණය දාදු කැටයේ පැත්තක් වැටීමට ඇති ඉඩකඩ 1/6 ක් ලෙස වේ. එහෙත් මෙම සසම්භාවී ලක්ෂණය ගිනි පෙට්ටියේ පැති වැටීමට අදාළ නොවේ. මෙය පැහැදිලි කරන්න.
II. පැත්තක විශාලත්වය 1/4, 3/20, 1/10 යන සම්භාවිතා මාන පිළිවෙළින් දී, ගිනි පෙට්ටිය උඩ විසි කළ විට යම් පැත්තක් උඩු අතට වැටීමේ සම්භාවිතාව ගණනය කිරීමේ වඩා සාධාරණ ක්‍රමයක් ගොඩනැගිය හැකි අන්දම පෙන්වා දෙන්න.
III. X බෑගයේ කලු බෝල 5ක් හා රතු බෝල 2ක් ඇත. Y බෑගයේ කලු බෝල 2ක් හා රතු බෝල 3ක් ඇත. ළමයෙක් දෑස් පියාගෙන X බෑගයෙන් බෝලයක් ගෙන Y බෑගයට දමයි. ඉන්පසු දෑස හැර Y බෑගය හොඳින් සොලවා එයින් බෝලයක් ගනියි. එම ගන්නා බෝලය රතු පැහැ බෝලයක් වීමේ සම්භාවිතාව සොයන්න.